ඉතිහාසය

පළමු වාර පරීක්ෂණය-2024 | 7 ශ්‍රේණිය | කාලය පැය 02

- නිවැරදි පිළිතුර තෝරා අංකය සඳහන් කරන්න.

1. තෝනිගල ශිලා ලිපියට අනුව මහකන්නය හැඳින්වූයේ
   I. පිටදඩහය
   II. මඩහස
   III. අකලහස
   IV. මදහස

2. අතීතයේ අපේ රටේ සිටි ජනතාව ප්‍රධාන ජීවන වෘත්තිය ලෙසතෝරා ගත්තේ
   I. ධීවර කටයුතු
   II. කෘෂි කර්මාන්තය
   III. වෙළදාම
   IV. කර්මාන්තය

3. ගිරි නම් ජනපදයේ සහෝදරයන් පස් දෙනෙකු උඳු වැපිරීමට හේනක් සකස් කර ගැනීම පිළිබඳ කතා පුවතක් සඳහන් වන මූලාශ්‍රය වන්නේ
   I. මහාවංශයයි
   II. උම්මංග ජාතකය
   III. දීපවංශය
   IV. සද්ධර්මාලංකාරය

4. සෙල්ලිපිවල පිටබිම් ලෙස හැඳින්වූයේ
   I. කුඹුරුය
   II. වී බීස්සය
   III. වෙළඳපලවල්ය
   IV. හේනය

5. සාලිය කුමරා උපන් කාලයේ හේන්වල ඇති වී අස්වැන්න වැඩි වූ බව සඳහන් කරන මූලාශ්‍රය වන්නේල
   I. සීහලවත්ථු
   II. මහාවංශය
   III. දීපවංශය
   IV. තෝනිගල සෙල්ලිපිය

6. පණ්ඩුකාභය රජතුමා ළමා කාලය ගතකර ඇත්තේ කිනම් ගොපලු ගමේද
   I. තිසාවැරටිය
   II. බුත්තල
   III. දොරමඩලාව
   IV. අම්පාර

7. සකපෝරුව භාවිතා කරන ලද්දේ මින් කුමන කර්මාන්තයක් සඳහාද
   I. ලෝහ කර්මාන්තය
   II. පේෂ කර්මාන්තය
   III. උක් කර්මාන්තය
   IV. මැටි කර්මාන්තය

8. අත්තම් ක්‍රමය යනු කුමක්ද
   I. ශ්‍රමයට ශ්‍රමය හුවමාරුව
   II. හස්ත කර්මාන්තය
   III. දැතින් නිර්මාණ ඉදිරිපත් කිරීම
   IV. ශ්‍රමයට මුදල් ගෙවීම

9. වී ගොවිතැනේදී ගොයම් පෑගීම සිදු කල ස්ථානය හඳුන්වන නම කුමක්ද
   I. වී බිස්ස
   II. කනත්ත
   III. කමත
   IV. ලියැද්ද

10. 'පූග' යනුවෙන් අතීත මූලාශ්‍රවල හඳුන්වා ඇත්තේ
   I. වෙළඳ ගමය
   II. වෙළඳ සංවිධානය
   III. වෙළඳ භාණ්ඩය
   IV. වෙළඳ නගරය

11. බදුලු ටැම් ලිපිය කරවන ලද රජතුමාගේ නම කුමක්ද
I. IV වන උදය
II. II වන කස්සප
III. I වන සේන
IV. V වන මිහිඳු

12. තම මවට ඉතා ආදර ගෞරවයෙන් ඇප උපස්ථාන කල රජතුමා වන්නේ
I. I වන සේන
II. I වන කස්සප
III. III වන සේන
IV. VIII වන අග්ගබෝදි

13. අතීතයේ සූප ශාස්ත්‍රයේ (ආහාර පිසීමේ) දක්ෂ කාන්තාවන් හැඳින්වූයේ
I. රසවාහිනි
II. සූපවේදිනි
III. මධුපාවිකා
IV. ස්වර්ණපාලි

14. මානවම්ම කුමරු ආරක්ෂාව පතා ඉන්දියාවේ කුමන රාජ්‍යයට පලා ගියේද
I. පල්ලව
II. කේරල
III. චෝල
IV. පාන්ඩ්‍ය

15. I වන සේන රජුගේ පියා කවුරුන්ද
I. III වන අග්ගබෝදි
II. II වන දප්පුල
III. I වන විජයබාහු
IV. IV වන මහින්ද

16. I වන සේන රජුගේ කාලයේදී ශ්‍රී ලංකාවට ආක්‍රමනයක් එල්ල කල පාන්ඩ්‍ය රජු කවුරුන්ද
I. දෙවනා වරගුනවර්මන්
II. රාජරාජ
III. ශ්‍රීමාර ශ්‍රී වල්ලභ
IV. රාජේන්ද්‍ර

17. දෙවන නරසිංහවර්මන් රජුගෙන් උපකාර ලබාගත් ලාංකීක කුමාරයා වන්නේ
I. මුගලන් කුමරු
II. මානවම්ම කුමරු
III. පණ්ඩුකාභය කුමරු
IV. කස්සප කුමරු

18. අතීතයේ ගෝකන්න ලෙස හැඳින්වූ ස්වභාවික වරාය පිහිටියේ
I. හම්බන්තොට
II. මන්නාරම
III. මාතර
IV. ත්‍රිකුණාමලය

19. ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ පිහිටා තිබූ වරායකි
I. දඹකොළපටුන
II. ගෝකන්න
III. ගොඩවාය
IV. ලංකාපට්ටන

20. අතීත සමාජයේ පැවති විවාහය පිළිබඳව නොගැළපෙන පිළිතුර කුමක්ද
I. දෙමාපිය ආශිර්වාදය ලබා ගත යුතුය.
II. සිරිත් විරිත් වලට මුල් තැන දිය යුතුය.
III. පෙළපතට ගැළපෙන විවාහයක් විය යුතුය.
IV. තම කැමැත්තට මුල් තැන දිය යුතුය.

7 ශ්‍රේණිය ඉතිහාසය - පළමුවාරය -

Learning Resource Centre
R
De Mazenod College
Kandana

II කොටස

*පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
*අනෙකුත් ප්‍රශ්න අතරින් ප්‍රශ්න හතරක් තෝරා පිළිතුරු ලියන්න.
*පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන පහකි.

1. පිංතූර අධ්‍යනය කර පිළිතුරු ලියන්න.

A.



I. A පිංතූරයෙන් දැක්වෙන්නේ කුමක්ද
II. මෙය හමු වී ඇත්තේ කුමන ස්ථානයකින්ද
III. මෙය නිර්මාණය කර ඇති ලෝහ වගර්ය කුමක්ද
IV. මෙහි දක්නට ඇති සංකේතයක් ලියන්න.

B.



I. B රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද
II. මෙම රූපය කුමන කටයුත්තකට යොදා ගන්නේද

C.



I. C රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද
II. එය හඳුන්වා දෙන්න.

2.

I. හේනක් යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද

II a. හේන් වගාව සඳහා භාවිතා කරන උපකරණ 2ක් ලියන්න.

b. හේනක වගා කරන බෝග වර්ග දෙකක් ලියන්න.

III.

a. හේන ආරක්ෂා කිරීමට අනුගමනය කරන ක්‍රමවේද 3 ක් ලියන්න.

b. හේන් ගොවිතැනේදි භාවිතා කරන වචන 2ක් ලියන්න.

3.

I. මෙරට සිටි විදේශීය වෙළඳ ශ්‍රේණි දෙක නම් කරන්න.

II. මෙරටට අතීතයේදි ආනයනය කල භාණ්ඩ 2ක් හා අපනයනය කල භාණ්ඩ 2ක් ලියන්න.

III.

a. ලංකාව වෙළඳ සම්බන්ධතා පැවැත්වූ රටවල් 3ක් ලියන්න.

b. විදේශ වෙළඳාමේදි වරාය ආශ්‍රිත රාජකාරිවල නිරත වූ පුද්ගලයන් හඳුන්වන නම කුමක්ද

4.

I. මඩ ගොවිතැන සඳහා යොදාගත් උපකරණ 2ක් ලියන්න.

II. අතීතයේ වී වගා කල කන්න 2ක් ලියන්න.

III. ගොයම් ආරක්ෂා කිරීමට භාවිතා කරන ලද සම්ප්‍රදායික ක්‍රම දෙකක් විස්තර කරන්න.

5.

I. ප්‍රවාහනය සඳහා යොදාගත් ගවයන් හැඳින්වූයේ කිනම් නමකින්ද

II. කිරි ලබා ගත් ගවදෙනුන් හැඳින්වූයේ කිනම් නමකින්ද

III. පස්ගෝරස හඳුන්වන්න.

6.

I. අතීතයේදී පැවති කර්මාන්ත දෙකක් ලියන්න.

II. එම කර්මාන්ත ආශ්‍රිතව නියලුන ශිල්පීන් නම් කරන්න.

III. දේශීය වෙළදාමේදී පැවති වෙළඳපළ නීති දෙකක් විස්තර කරන්න.

7.

I. මානවම්ම රජ පෙළපතට අයත් රජවරු දෙදෙනෙක් නම් කරන්න.

II. දකුණු ඉන්දීය රාජ්‍යයන් 3 ක් නම් කරන්න.

III. එම රාජ්‍ය වල අගනුවරවල් නම් කරන්න.

IV. අතීතයේ රජකම උරුම වීමේ ප්‍රධාන ක්‍රම 2ක් සඳහන් කරන්න.